ද මැසිනොද් විදුහල - කඳාන

2 වන වාර පරීක්ෂණය - (2019 ජූලි)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

10 ශ්‍රේණිය

24-07-2019

කාලය - පැ. 01

- ඉතාමත් නිවැරදි පිළිතුර තෝරා අංකය සටහන් කරන්න.

(1) මිනිසාගේ මූලික අවශ්‍යතා ඇතුලත් කාණ්ඩය වනුයේ,
   1) ආහාර , අධ්‍යාපනය, ගමනාගමනය, සන්නිවේදනය
   2) ආහාර , ඇඳුම් , නිවාස, සෞඛ්‍ය , අධ්‍යාපනය
   3) ආහාර , නිවාස, සෞඛ්‍ය, රථ වාහන, ජංගම දුරකථන
   4) ආහාර , ඇඳුම් , රථ වාහන, සෞඛ්‍ය , නිවාස

(2) මිනිස් අවශ්‍යතාවයක් ලෙස සැලකිය හැක්කේ,
   1) මෝටර රථ   2) ජංගම දුරකථන   3) නිවාස   4) රූපවාහිනිය

(3) වර්තමාන වෙළෙඳාමට පදනම වී ඇත්තේ,
   1) ස්වයං පරිභෝජන නිෂ්පාදනය
   2) භාණ්ඩ හුවමාරුව
   3) මුදල් භාවිතය
   4) කාර්මික විප්ලවය

(4) හොඳ මුදලක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
   1) කල් පැවැත්ම
   2) පහසුවෙන් මුද්‍රණය කළහැකි වීම.
   3) පොදු පිළිගැනීම
   4) කුඩා කොටස් වලට වෙන්කළ හැකි වීම.

(5) මිනිස් උවමනා වල ලක්ෂණයක් වන්නේ,
   1) සීමිත වීම.   2) සරල වීම   3) සංකීර්ණ වීම   4) පොදු වීම

(6) පහත සඳහන් ව්‍යාපාර අතිරින් සේවා සැපයීමේ ව්‍යාපාරයක් වන්නේ,
   1) බීම්මල් නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරය
   2) මීකිරි අලෙවි රථයක්
   3) කාන්තා පාවහන් සැකසුම් ආයතනයක්
   4) පොදු නීති හා උපදෙස් සපයන නීතිඥ කාර්යාලයක්

(7) ව්‍යාපාරයක පැවැත්ම තහවුරු කරන අභ්‍යන්තර පරිසරය සාධකයක් වන්නේ,
   1) අයිතිකරු   2) ගණුදෙනු කරු   3) සැපයුම් කරු   4) රජය

(8) ආර්ථික පරිසරයට පමණක් අයත් සාධක ඇතුලත් බණ්ඩය වන්නේ,
   1) මිල මට්ටම, සිරිත් විරිත්, වැටුප් මට්ටම, පොලී අනුපාතය
   2) මිල මට්ටම, පොලී අනුපාතය, විනිමය අනුපාතය, වැටුප් මට්ටම.
   3) මිල මට්ටම , කළමනාකරණය ගැටළු, පොලී අනුපාත
   4) පොලී අනුපාතය , අන්තර් ජාලය, ක්‍රීඩා කටයුතු, මිල මට්ටම.

Learning Resource Center
R
De Mazenod College
Kandana

(9) ව්‍යාපාර පරිසරයට අනුව අභ්‍යන්තර පරිසරයට ඇතුලත් වන්නේ,

1) අයිතිකරුවන්, සේවකයන් , සැපයුම්කරුවන්
2) කළමණාකරුවන්, ගණුදෙනු කරුවන්, සේවකයන්
3) අයිතිකරුවන් , කළමණාකරුවන්, සේවකයන්
4) සැපයුම්කරුවන්, සේවකයන්, තරඟකරුවන්

(10) ව්‍යාපාර සංවිධාන වර්ග කළහැකි ප්‍රධාන නිර්නායකයන් ඇතුලත් පිළිතුර වන්නේ,

1) අරමුණ , ස්ථානය, පරිමාණය
2) පරිමාණය , හිමිකාරිත්වය , ස්වාර්ථය
3) හිමිකාරිත්වය, පරිමාණය, අරමුණ,
4) අරමුණ , හිමිකාරීත්වය, අයිතිවාසිකම

(11) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු අවම සහ උපරිම සාමාජික සංඛ්‍යාව තීරණය වන පනත,

1) 1890 හවුල් ආඥා පනත
2) 1918 ව්‍යාපාර නාම ආඥා පනත
3) 2007 අංක 07 දරණ සමාගම් පනත
4) 1972 අංක 04 දරණ සමූපකාර පනත

- ප්‍රශ්න අංක (12), (13) , (14) සඳහා පිළිතුරු පහත සිද්ධිය තුලින් තෝරන්න.

"කෘෂිකර්ම උපාධිධාරියෙකු වන සුගතදාස මහතා තම ගෙවත්තේ එළවළු හා පලතුරු වගා කර තම පරිභෝජනය සඳහා භාවිතා කර ඉතිරිය සාධාරණ මිලකට තම අසල්වැසියන්ට අලෙවි කරයි".

(12) සුගතදාස මහතාගේ ශක්තියක් වන්නේ,

1) ඉලක්ක වෙළෙඳපොළ පැවතීම.
2) අවට පාරිභෝගිකයන් සිටීම.
3) කෘෂිකර්ම උපාධිධාරියෙකු වීම.
4) ඉහළ අධ්‍යාපනය සුදුසුකම් තිබීම.

(13) ඉහත සිද්ධියට අදාල නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) ඉහත ව්‍යාපාර කටයුතු වලට නෛතික පුද්ගල භාවයක් ඇත.
2) ඔහු සෘජු නිෂ්පාදනයේ පමණක් යෙදේ.
3) මෙය මහා පරිමාණ ව්‍යාපාරයකි.
4) ඔහු සෘජු හා වක්‍ර යන නිෂ්පාදන වල යෙදේ.

(14) සුගතදාස මහතාගේ ව්‍යාපාරයට එල්ලවිය හැකි තර්ජනයක් වන්නේ,

1) අවට පරිසරයේ පවතින පිරිසිදු වාතාශ්‍රය
2) කෘමි උවදුරක් රට පුරා ව්‍යාප්ත වීම.
3) රජයේ පොහොර සහනාධාරය
4) ලෝක වෙළෙඳපොළේ බෝරතෙල් මිල පහළ යාම.

(15) කුඩා පරිමාණ ව්‍යාපාරයක් යනු,

1) කුඩා ප්‍රාග්ධනයක් හා අඩු සේවක සංඛ්‍යාවක් සහිත ව්‍යාපාර
2) ග්‍රාමීය ප්‍රදේශවල ස්ථානගත වී ඇති ව්‍යාපාර
3) අදාළ කර්මාන්තය තුළ ආධිපත්‍ය පතුරුවන ව්‍යාපාර
4) සේවක සංඛ්‍යාව නිශ්චිතවම කිව නොහැකි ව්‍යාපාර

5 000 ක් වටිනා ගෘහ භාණ්ඩ අත්පිට මුදලට මිලදී ගත් විට,
වත්කම් අඩුවේ,	වගකීම් වැඩිවේ
වත්කම් අඩු වේ,	වත්කම් වැඩිවේ
වත්කම් අඩු වේ,	වියදම් වැඩිවේ
වත්කම් අඩු වේ,	හිමිකම් වැඩිවේ

තිකරු තම පෞද්ගලික මුදලින් රු. 2 000 ක් ණය හිමියන්ට ගෙවීම සටහන් වන්නේ,
වත්කම් අඩු වීම, වගකීම් අඩුවීම
අයිතිකරුගේ හිමිකම වැඩිවීම, වගකීම් අඩුවීම
අයිතිකරුගේ හිමිකම අඩුවීම , වගකීම් අඩුවීම
මුදල් අඩුවීම , වගකීම් අඩුවීම

කම් වැඩිවීම, වගකීම් වැඩිවීම යන ද්විත්ව බලපෑමට අදාළ ගනුදෙනුව විය හැක්කේ,
රු. 2 000 ක් විදුලි බිල ගෙවීම
රු. 3 000 ක් ණයගැතියන් මුදල් පියවීම.
රු. 2 000 ක ණයට ගැනුම්
රු. 3 000 බැංකු ණය පොලී ගෙවීම.

8.01.01 ප්‍රාග්ධනය රු. 200 000
8 වර්ෂයේ ආදායම් රු. 100 000
8 වර්ෂයේ වියදම් රු. 82 000
8 වර්ෂයේ අමතර මුදල් ආයෝජනය රු. 20 000
ට 2018 වර්ෂයේ 12.31 දිනට ප්‍රාග්ධනය වන්නේ,
රු. 238 000	2) රු. 382 000	3) රු. 402 000	4) රු. 312 000

ම්කරණ මූලධර්ම අනුව 'වියදම් වැඩිවීම'
සැම විටම 'හර' වේ
සැම විටම 'බැර' වේ
සමහර අවස්ථාව 'හර' හෝ 'බැර' විය හැක.
වත්කම් ගිණුම් තුළ 'හර' වේ

මේ 'බැර' පැත්තේ සටහන් වියහැකි ගනුදෙනු වන්නේ,
රු. 2 000 ක ගෙවල් කුලී ලැබීම
රු. 2 000 ක ණය ගැති මුදල් පියවීම
රු. 2 000 ක ණය හිමි මුදල් පියවීම
රු. 2 000 ක අත්පිට විකුණුම් කිරීම.

සාර අයිතිකරු ගේ හිමිකම දැක්වෙන නිවැරදි සාණ්ඩය වන්නේ,
වත්කම් + වගකීම්	2) වත්කම් - වගකීම්	3) වත්කම් + ප්‍රාග්ධනය	4) වත්කම් - ප්‍රාග්ධනය

ම බැර, වැඩිවීම හර යන ගිණුම්කරණ මූලධර්මය අදාල වනුයේ,
ආදායම් හා වියදම් ගිණුම් වලට ය.
වත්කම් හා හිමිකම් ගිණුම් වලට ය.
වත්කම් හා වියදම් ගිණුම් වලට ය.
වියදම් හා ආදායම් ගිණුම් වලට ය.

(37) මුදල් පොතක ගනුදෙනු සටහන් කරනුයේ,
1) වගකීම් මූලධර්මයට අනුව ය
2) ආදායම් මූලධර්මයට අනුව ය
3) වියදම් මූලධර්මයට අනුව ය
4) වත්කම් මූලධර්මයට අනුව ය

(38) ව්‍යාපාරික ගනුදෙනුවක ද්විත්ව බලපෑම් හර සහ බැර වශයෙන් සටහන් කිරීම සඳහා යොදාගනු ලබන ආකෘතිය,
1) ලෙජරය ලෙස හඳුන්වයි
2) ගිණුම ලෙස හඳුන්වයි
3) උපයෝගී පොත ලෙස හඳුන්වයි
4) ජ'නලය ලෙස හඳුන්වයි

(39) මුදල් ගිණුමේ සටහන් නොවන ගනුදෙනුව කුමක් ද?
1) අත්පිට විකුණුම් රු. 10 000
2) ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම රු. 7 000
3) ණයට භාණ්ඩ ගැනුම් රු. 7 500
4) ණය මුදලක් ලබා ගැනීම රු. 15 000

(40) ව්‍යාපාරයක සම්පත් සහ සම්පත් සපයනා පාර්ශවලට එම සම්පත් සම්බන්ධයෙන් ව්‍යාපාරයේ ඇති බැඳීම පිළිබිඹු කරන ගණිතමය ඉදිරිපත් කිරීම හඳුන්වන්නේ,
1) ගිණුම්කරණ මූලධර්ම වශයෙනි.
2) ද්විත්ව සටහන් න්‍යාය වශයෙනි.
3) ගිණුම්කරණ සමීකරණ වශයෙනි.
4) ගිණුම්කරණ සංකල්ප වශයෙනි.

24.07.2019

(16) "පාරිභෝගික ක්‍රය ශක්තිය" සහ "පාරිභෝගික මිල දර්ශකය" යන සාධක ඇතුලත් වන්නේ,

1) ප්‍රජා පරිසරය ට 2) තාක්ෂණික පරිසරය ට 3) ගෝලීය පරිසරය ට 4) ආර්ථික පරිසරය ට

(17) පහත සඳහන් ඒවා අතරින් හවුල් ව්‍යාපාරයක් හා සැසඳීමේදී කේවල ස්වාමි ව්‍යාපාරයක වාසියක් ලෙස පිලිගත හැක්කේ,

1) ඉක්මණින් තීරණ ගත හැකි වීම.
2) වැඩි ප්‍රාග්ධනයක් සපයාගත හැකි වීම.
3) අඛණ්ඩ පැවැත්මක් තිබීම.
4) වඩාත් නිවැරදි තීරණ ගතහැකි වීම.

(18) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇතුලත් නිවැරදි කාණ්ඩය තෝරන්න.

A. - අනන්‍යතාවයක් ලැබීම.
B. - ව්‍යාපාර නාමය තහවුරු වීම.
C. - රජයේ සියලු දිරිගැන්වීම් ලබාගත හැකිවීම.
D. ඕනෑම වෙලාවක අවශ්‍ය ප්‍රමාණයට ණය ලබාගත හැකි වීම.

1) A,C 2) A,D 3) A,B 4) B,D

(19) නුවන්ත රත්නායක "නිව් ෆැෂන්" නමින් නිමි ඇඳුම් අලෙවි ව්‍යාපාරයක් ආරම්භ කළේය. මෙය ව්‍යාපාර නාම ආඥා පනත යටතේ අනිවාර්යයෙන්ම ලියාපදිංචි කළයුතුව ඇත. මීට අදාළ පරිසරය වන්නේ,

1) අභ්‍යන්තර පරිසරය
2) නෛතික පරිසරය
3) දේශපාලන පරිසරය
4) ආර්ථික පරිසරය

(20) එළවළු වගාවේ යෙදෙන සුවාරිස් ගොවි මහතා අනෙකුත් එළවළු වගාකරුවන්ට වඩා සරු අස්වැන්නක් ලබා ගනී. තම ගොවිපලේ කටයුතු වලට වැඩිමහල් පුතු ද සහය කර ගනිමින් අස්වැන්න වෙළෙඳසල් වලට බෙදා හරියි. හිමිකාරිත්වය අනුව මෙම ව්‍යාපාරය අයත් වන්නේ,

1) ඒකපුද්ගල ව්‍යාපාර සංවිධාන වර්ගයට
2) හවුල් ව්‍යාපාර සංවිධාන වර්ගයට
3) සීමා සහිත පුද්ගලික සමාගම්
4) සමිති සංවිධාන වලට

(21) ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි.

1) සීමා සහිත සමාගම
2) හවුල් ව්‍යාපාර
3) කේවල ස්වාමි ව්‍යාපාර
4) සමුපකාර ව්‍යාපාර

(22) ව්‍යාපාර සංවිධාන කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

A. - ජයසිංහ සහ පුත්‍ර සමාගම
B. - රංගි බියුටි සැලූන්
C. - සීමා සහිත ගුණසේකර සමාගම
D. ජාතික ලොතරැයි මණ්ඩලය

ඉහත සංවිධාන, ව්‍යාපාර සංවිධාන වර්ගය අනුව පෙළගැස්වූ විට,

1) කේවල ස්වාමි ව්‍යාපාර , හවුල් ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම්
2) හවුල් ව්‍යාපාර, සීමා සහිත පොදු සමාගම්, රාජ්‍ය සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර
3) හවුල් ව්‍යාපාර, කේවල් ස්වාමි ව්‍යාපාර, සී/ස පොදු සමාගම් , රාජ්‍ය සංස්ථා
4) සී/ස පොදු සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා, හවුල් ව්‍යාපාර

Learning Resource Center
R
De Mazenod College
Kandana

(23) වත්කම් වල ලක්ෂණයක් වන්නේ,

1) කෙටිකාලීන පැවැත්ම
2) අනාගත ප්‍රයෝජන ව්‍යාපාරයට ගෙන ඒම.
3) ව්‍යාපාරයෙන් මුලා වත්කම් පිටතට ගලා යාම.
4) බාහිර පරිසර බලවේග වලින් තොර වීම.

(24) ජංගම වගකීමක් ඇති කෙරෙන ගනුදෙනුව වන්නේ,

1) රු. 30 000 ක් වටිනා ගෘහ භාණ්ඩ මිලට ගැනීම.
2) රු. 4 000 ක් ගෙවා විදුලි බිල පියවීම.
3) රු. 10 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
4) රු. 10 000 ක වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම.

(25) - රු. 20 000 ක් ආයෝදා ව්‍යාපාරය ආරම්භ කිරීම.
- රු. 40 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
- රු. 5 000 ක් වටිනා තොග රු. 7 000 කට ණයට විකිණීම.

ඉහත ගනුදෙනුව ගැලපීමෙන් පසු අවසාන ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් (රු) |
|---|---|---|---|---|---|
| 1) | 62 000 | = | 22 000 | + | 40 000 |
| 2) | 67 000 | = | 27 000 | + | 40 000 |
| 3) | 65 000 | = | 40 000 | + | 25 000 |
| 4) | 130 000 | = | 60 000 | + | 70 000 |

(26) අයිතිකරුගේ හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනුව නොවන්නේ,

1) අයිතිකරු පුද්ගලික ප්‍රයෝජනයට ගන්නා රු. 1 000 ක මුදල
2) රු. 2 500 ක් විදුලි බිල ගෙවීම.
3) රු. 2 500 ක කොමිස් ආදායමක් ලැබීම.
4) රු. 1 000 ක භාණ්ඩ ගැනිලි

(27) පහත ඒවායින් ජංගම නොවන වත්කම තෝරන්න.

1) රු. 100 000 බැංකු කාසි
2) රු. 100 000 ක අතැති මුදල්
3) රු. 100 000 ක ගෘහ භාණ්ඩ
4) රු. 100 000 ක ණය ගැතියෝ

(28) රු. 12 000 ක අත්පිට ගැණුම් සඳහා ද්විත්ව සටහන වන්නේ,

1) මුදල් ගිණුම හර රු. 12 000
ගැනුම් ගිණුම බැර රු. 12 000
2) මුදල් ගිණුම හර රු. 12 000
විකුණුම් ගිණුම බැර රු. 12 000
3) ගැනුම් ගිණුම හර රු. 12 000
ණයහිමි ගිණුම බැර රු. 12 000
4) ගැනුම් ගිණුම හර රු. 12 000
මුදල් ගිණුම බැර රු. 12 000

# ද මැසිනොද් විදුහල - කඳාන

**2 වන වාර පරීක්ෂණය - (2019 ජූලි)**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**

**10 ශ්‍රේණිය**

**කාලය - පැ. 02**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- I හා II කොටස් වලින් ප්‍රශ්න 2 බැගින් තෝරා ලියන්න.
- මුළු ප්‍රශ්න සංඛ්‍යාව <u>පහකි.</u>

(1) පහත දැක්වෙන සිද්ධිය අධ්‍යයනය කරන්න.

දිලුම් ජයසූරිය 2018 ජනවාරි මාසයේ පළමු දින තම සිහිනය වූ "දිලුම් ගාමන්ට්ස්" ආරම්භ කලේ ඔහු සතු ඉතුරුම් වලින් රු. 200 000 ක් සහ ඔහුගේ රු. 500 000 ක් වටිනා මෝටර් වැන් රථය ව්‍යාපාරයට ආයෝජනය කරමින් ය. දිලුම් කුඩා කලසිටම තම පියාගෙන් උරුම වූ ව්‍යාපාර බුද්ධිය ඉස්මතු කළ අතර, එමනිසාම පියාගේ මග පෙන්වීම තුළ අ.පො.ස. (උ.පෙළ) වාණිජ විෂය ධාරාවෙන් හදාරා, වෘත්තීය පුහුණු ආයතනයක ඇඟළුම් කර්මාන්තය පිළිබඳ අවුරුදු දෙකක පාඨමාලාවක් හදාරන ලදි. ඉන් අනතුරුව පරිගණක පාඨමාලාවක නිරතවූ දිලුම් එහිදී විවිධ මැහුම් ක්‍රම, මැහුම් රටා, විලාසිතාවන් නවීන තාක්ෂණය ඔස්සේ ලබා ගන්නා ආකාරය හදාරන ලදී.

ඔහුගේ උපන් නිවස නාගරික ප්‍රදේශයක පිහිටා ඇති බැවින් එහි හිස් ඉඩම් ප්‍රමාණයක තම ගොඩනැගිල්ල ඉදි කිරීමට රු. 350 000 ක් වියදම් කරන ලදී. එය ඔහුට තම පියාගෙන් ත්‍යාගයක් ලෙස ලැබුණු හෙයින් ඉදිරි වැඩ කටයුතු වෙනුවෙන් රු. 100 000 ක අමතර බැංකු ණයක් ලබා ගැනීම 2018 ජනවාරි 10 වන දින සිදු කරන ලදී.

නව විලාසිතාවන් අනුව නිම කරන ලද නිමි ඇඳුම් සඳහා සැහෙන වෙළෙඳපොළක් කෙටි කාලයකදී අයත් කර ගැනීමට දිලුම් ට හැකිවිය. ඔහු පෙබරවාරි මස පළමු වන දින රු. 25 000 ක වේතනයකට යටත්ව සේවකයන් දෙදෙනෙකු ඔහුගේ මැහුම් ව්‍යාපාරයට යොදන ලදී.

1) දිලුම් ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද?

2) මෙම ව්‍යාපාරයේ ශක්තීන් දෙකක් ලියන්න.

3) දිලුම් ව්‍යාපාරය ලියාපදිංචිය අනිවර්යය ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

4) මෙම ව්‍යාපාරයෙන් සපුරාලන මූලික අවශ්‍යතාවය සඳහන් කරන්න. මූලික අවශ්‍යතා වල ලක්ෂණ 2ක් ලියා දක්වන්න.

5) මෙම ව්‍යාපාරයේ වැඩකටයුතු වෙනුවෙන් ලබාගත් රු. 100 000 මුදල යෙදවිය හැකි ආකාර 2ක් ලියා දක්වන්න.

6) මෙහි සඳහන් පරිදි නාගරික ප්‍රදේශයක පිහිටීමෙන් ඇතිවිය හැකි තර්ජන 2ක් ලියා දක්වන්න.

7) දිලුම් ගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි 1 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

8) මෙම ව්‍යාපාරය සතු ස්ථාවර වත්කම් 2ක් සඳහන් කරන්න.

9) වෙනම සේවකයන් 2ක් නියුක්ත කිරීමෙන් මාසික ඔවුන්ට ගෙවන වේතනයට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

10) 2018 ජනවාරි 10 වන දින බැංකු ණය ලබා ගැනීම ගිණුම්ගත කරන්න.

( 2 x 10 = 20)

Learning Resource Cen
R
De Mazenod College
Kandana

## II කොටස

මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.

(2) .

i. ව්‍යාපාරයක් යනු කුමක් ද? (ල.2)

ii. මිනිස් උවමනාවන් හි ලක්ෂණ 2ක් ලියා දක්වන්න. (ල.2)

iii. හවුල් ව්‍යාපාරයක් සඳහා බලපාන පණත් දෙකක් ලියන්න. (ල.2)

iv. පහත වාක්‍ය හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

a. ව්‍යාපාරයක දුර්වලතා තුලින් තර්ජන ඉවත් කළ හැක. ( )

b. නෛතික පුද්ගල භාවය හිමි වීම රාජ්‍ය සමාගම් වල වාසියකි. ( )

c. ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව යනු එම ව්‍යාපාරයේ ගණකාධිකරණ තොරතුරු ලබා ගන්නා පර්ශවය යි. ( )

d. ආර්ථිකයේ පොදු මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාම උද්ධමනය ලෙස හැඳින්වේ. ( )

(ල.2)

(මුළු ලකුණු 8)

(3) .

i. සමුපකාර ව්‍යාපාරයක මූලික ලක්ෂණ 4 ක් ලියන්න. (ල.2)

ii. රාජ්‍ය සංස්ථාවල වාසියක් සහ අවාසියක් බැගින් ලියන්න. (ල.2)

iii. ශ්‍රී ලංකාවේ දැනට ඇති රාජ්‍ය දෙපාර්තමේන්තුවක් සඳහා රාජ්‍ය සංස්ථාවක් නම් කරන්න. (ල.2)

පහත වාක්‍ය හරි නම් ( √ ) ලකුණ ද වරදි නම් ( X ) ලකුණ ද යොදන්න

a. ව්‍යාපාර නාම ආඥා පනත 1918 අංක 07 දරණ පනත වේ. ( )

b. ගෘහස්ත ගෑස් මිල ඉහළ යාම ප්‍රජා පරිසරයේ සාධකයකි. ( )

c. 1968 හවුල් ආඥා පනත අනුව හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව 25 කි. ( )

d. හවුල් ව්‍යාපාරයක් ලිඛිතව මෙන්ම වාචිකව ද ආරම්භ කළ හැක. ( )

(ල.2)

(මුළු ලකුණු 8)

(4) .

i. ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ වාසි 2ක් ලියන්න. (ල.2)

ii. පහත පද කෙටියෙන් හඳුන්වන්න.

a. කළමණාකරුවන්

b. ව්‍යාපාර අවස්ථා

c. නෛතික පුද්ගල භාවය

d. සීමිත වගකීම

(ල.4)

iii. නිෂ්පාදන සාධක යනු මොනවා ද? ඒවා වර්ගකර දක්වන්න. (ල.2)

(මුළු ලකුණු 8)

## IIIකොටස

මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.

5) .

i. වත්කම් හඳුන්වා ඒවායේ ලක්ෂණ 2ක් ලියන්න. (ල.2)

ii. වගකීම් බෙදා වෙන් කෙරෙන ප්‍රධාන ආකාර 2ක් ලියා නිදසුන බැගින් දක්වන්න. (ල.2)

iii. පහත ගනුදෙනු මූලික ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

සැප්තැම්බර් 01 - ප්‍රාග්ධනය රු. 25 000 ක් ව්‍යාපාරයට යෙදවීම.

03 - රු. 10 000 ක් වටිනා පරිගණකය ව්‍යාපාරයට යෙදවීම

05 - බැංකු ණය රු. 20 000 ක් ලබා ගැනීම

10 - වෙළෙඳ භාණ්ඩ ණයට ගැණුම් රු. 1 000

12 - අත්පිට විකුණුම් රු. 1 500 (භාණ්ඩ තොගයේ පිරිවැය රු. 1 300)

14 - බැංකු ණය පොලී රු. 500 ක් ගෙවීම

20 - ව්‍යාපාරයේ විදුලි බිල ගෙවීම රු. 800

25 - අයිතිකරු පුද්ගලික ප්‍රයෝජනයට මුදල් ලබා ගැනීම රු. 300 (ල.8)

6) .

i. ව්‍යාපාර ගනුදෙනුවක් යනු කුමක් ද? (ල.2)

ii. ගනුදෙනු ගිණුම්ගත කිරීමේ ප්‍රයෝජන 2ක් දක්වන්න. (ල.2)

iii. පහත ගනුදෙනු වල ද්විත්ව සටහන් ලියන්න.

a. රු. 150 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම.

b. රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම.

c. අයිතිකරු පුද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 2 000 ක් වටිනා භාණ්ඩ තොග ලබා ගැනීම.

d. විදුලි බිල රු. 300 ක් ගෙවීම. (ල.2)

iv. පහත සඳහන් එක් එක් ගැළපීම සඳහා ගනුදෙනුව බැගින් ලියන්න.

| | වත්කම් | = අයිතිකරුගේ හිමිකම | + වගකීම් |
|---|---|---|---|
| a. | + 10 000<br>- 10 000 | = - | - |
| b. | - 3 000 | = - 3 000 | |
| c. | +8 000 | = - | + 8 000 |
| d. | - 4 500 | = - | - 4 500 |
| e. | +1 500 | = +1 500 | |
| f. | - 6 000<br>+ 8 000 | = + 2 000 | |

(ල.6)

7) .

i. 'ලෙජරය' යනු කුමක් ද? (ල.1)

ii. ලෙජරයේ ඇති ප්‍රධාන ගිණුම් වර්ග මොනවා ද? (ල.2)

iii. 'ලෙජර් ගිණුම්' යනු කුමක් ද? (ල.1)

iv. පහත ගනුදෙනු රුවින්දගේ ව්‍යාපාරයෙන් 2019 ජනවාරි මාසයේදී ලබා ගන්නා ලදී.
ඒවා ගිණුම් ගත කරන්න.

1/5 අයිතිකරු රු. 30 000 ක් වටිනා ගෘහ භාණ්ඩ ව්‍යාපාරයට යෙදවීම.

1/10 අත්පිට ගැණුම් රු. 20 000

1/15 ණයට විකුණුම් සුනිල්ට රු. 4 000

1/20 කොමිස් ආදායමක් ලැබුණා රු. 3 000 (ල.8)